

**ආචාර්ය**
**සේන නානායක්කාර**
මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය
රජරට විශ්වවිද්‍යාලය



# නිදහස් චින්තනය, ජනමාධ්‍ය නිදහස සහ ජාතික නිදහස

මානවයා සමාජීය සත්ත්වයකු වශයෙන් බිහිවූ දා පටන් අවිඥානික ව හෝ ඔවුන්ගේ සිත් තුළ 'නිදහස' මුල් බැසගෙන තිබෙන්නට ඇත. දෑත නිදහස් කොට දෙපයින් නැඟී සිටින්නට සමත් වූ මේ සජීවී සත්ත්වයා පසුකාලීන සමාජ විකාශනයෙහි පෙරගමන්කරුවා විය. ඒ, ඔහු සතුව පැවති සිතීමේ, විමසීමේ හා යම් යම් කාර්යයන්හි නියැලීමේ ජීවවිද්‍යාත්මක ශක්‍යතාව පදනම් කොටගෙන යි.

ගල් යුගයේ හෙවත් දඩයම් යුගයේදී සතුන් මරාගෙන ජීවිතය ගෙවා දමන්නටත්, එඬේර යුගයේ දී සිය ජීවිත පවත්වා ගැනීම උදෙසා කෘෂි හා සත්ත්ව බෝග නිෂ්පාදනය කරන්නටත්, කාර්මික යුගයෙන් අනතුරු ව විධිමත් මානුෂිකත්වයක් ප්‍රකට කරන්නටත් ඔහුට හැකි වූයේ එබැවිනි.

මේ සකලවිධ ක්‍රම විකාශනයන්ගේත්, සමාජ ප්‍රවර්ධනයන්ගේත් කේන්ද්‍රීය අඩිතාලම නිදහස් චින්තනය යි. මිනිසාට කන්නට, බොන්නට,

අඳින්නට මෙන් ම ලියන්නට, කියවන්නට, විනෝද වන්නට හා සාකච්ඡා හා සම්මන්ත්‍රණ පවත්වන්නට ද නිදහස අවශ්‍ය වන්නේ එබැවිනි. එසේ නොවී නිදහස් චින්තනයක් බිහිකිරීම උගහට ය. සමාජයේ ගතානුගතික වූත්, නිෂ්ඵල වූත් සම්මතයනට ප්‍රබල බුද්ධිමය අභියෝග එල්ල කළ හැක්කේ නිදහස් චින්තනය ක්‍රියාත්මක වුවහොත් පමණි. එකී මතගැටුම් මිනිස් සමාජය දිනෙන් දින අලුත් කරවයි. ශිෂ්ටාචාර ගොඩනැගී ඇත්තේ ද එපරිද්දෙන් බව අපේ ඓතිහාසිකත්වය ප්‍රත්‍යවේක්ෂණය කිරීමේ දී පැහැදිලි වෙන සත්‍යය කි. එහිදී විද්‍යා, කලා, ආගමික හා දේශපාලන යන ක්ෂේත්‍රයන්හි මතගැටුම් මිනිස් ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථාන සනිටුහන් කරන බව කීම අතිශයෝක්තියක් නොවේ.

නිදර්ශනයක් ලෙස පෘථිවිය විශ්වයේ කේන්ද්‍රය ලෙස විශ්වාස කළ යුගයක් විය. මෙකී කේන්ද්‍රස්ථානය පාලනය කරනු ලබන මහේශාක්‍ය වූ දෙවියන්වහන්සේ උරණකොට නොගෙන එය අදහන ලෙස එවක මූලධර්මවාදී ආගම් නායකයෝ මිනිසාට දේශනා කළ හ. නමුත් ප්‍රබල වූ මිනිස් චින්තනයට වැටකඩුලු බැඳිය නොහැකි බව හෙළිකරමින් 'සූර්යකේන්ද්‍රවාදය' පිළිබඳ අදහස කොපර්නිකස් විසින් හෙළිකරන ලදී. විශ්වයේ පැවැත්ම තහවුරු කෙරෙන ජීව, රසායන හා භෞතික විද්‍යාත්මක ක්‍රියාකාරිත්වය තේරුම් ගන්නට උත්සාහ කරමින් සිටි බුද්ධිමත්හු පවා එම ආකල්පය පිළිබඳ සැක පහළ කළ හ. විශ්වයේ මැවුම්කරුවාණන් කෝපාවිෂ්ට වේ යැයි පූජකයෝ කීහ. හිරු, සඳු, තරු, පෘථිවිය ඈ නන්විධ ද්‍රව්‍යාත්මකයන් කෙරෙහි ලා හුදු දේවත්වය ම ආරෝපණය කොට සිටි ඔවුහු ඊට විරුද්ධ වන්නන්ට මරණ දඬුවම පවා නීතිගත කරනු ලැබූ හ. ඒ අනුව, කොපර්නිකස් මතය ජනතාව අතර ප්‍රචලිත කළ වරදට බෲනෝ පුළුස්සා මරා දමනු ලැබී ය. නමුත් අද අපි කොපර්නිකස් අදහමු. සත්‍යය එය බැවිනි.

මෙය, මුළුමහත් මානව ඉතිහාසය ම කැටිකොට ගත හැකි අංශුමාත්‍රික සරල සංනිදර්ශනයක් පමණි. මීට ම සමාන්තර සමාජ සංසිද්ධි අපමණ ය.

ඇරිස්ටෝටල්, ප්ලේටෝ, සොක්‍රටීස්, ගැලීලියෝ ආකිමිඩීස් හා කොපර්නිකස් ඈ නිදහස් චින්තකයින් හෙළි කළ මග ඔස්සේ නිදහස් ජනමාධ්‍යයක් කෙරෙහි ලා දිවි කැප කළ මහා පුරුෂයෝ කිහිප දෙනෙකි. 17 වන සියවසේ ජීවත් වූ ජෝන් මිල්ටන් (1608 - 1674) දහඅට

වැනි සියවසේ ජීවත් වූ ජෝන් අර්ස්කින්, තෝමස් ජෙෆර්සන් හා දහනව වැනි සියවසේ ජීවත් වූ ජෝන් ස්ටුවර්ට් මිල් (1806 - 1873) ඒ අතර වෙති. ගුරුත්වාකර්ෂණය පිළිබඳ තතු හෙළි කළ අයිසෙක් නිව්ටන්, මානවයාගේ පරිණාමය හඳුන්වා දුන් චාල්ස් ඩාවින් වැන්නවුන්ගේ නව සොයාගැනීම් මෙන් ම ඇඩම්ස්මිත්ගේ නව ආර්ථික සංකල්ප, ජෝන් ලොක් හා රූසෝ වැන්නවුන්ගේ සමාජහිතවාදී නව අධ්‍යාපනික උපදේශනයන් ද මෙකී නිදහස් චින්තනය ප්‍රචලිත කරවන්නට හේතුකාරක විය. පොදු මානව ශිෂ්ටාචාරය ගොඩනැගී ඇත්තේ එකී නිදහස් චින්තනයේ විපුල ඵල ලෙසිනි. නිදහස් චින්තනය එතරම් ම ප්‍රබල ය. එසේ නම්, අද අප කතා කරන ජනමාධ්‍ය නිදහස එහි අනුකාරක වූත්, අත්‍යවශ්‍ය වූත් තත්ත්වයක් නොවේ ද?

එකී පූර්විකාව මා විසින් සපයන ලද්දේ අප සාකච්ඡාවට ප්‍රස්තුත ජනමාධ්‍ය නිදහස වූ කලී සමාජ හිතවාදී සංකල්පමය පදනමක් බව ත්, එයින් තොර සැබෑ වූ පොදු මිනිස් නිදහසක් හා සැබෑ සමාජ ප්‍රගමනයක් ළඟා කරගත නොහැකි බවත් කුළුගන්වන්නට යි.

මෙහි දී අප මූලික ගැටලු කිහිපයක් ම විසඳාගත යුතු වෙයි. එනම්, නිදහස යනු කුමක් ද? සැබෑ ජනමාධ්‍ය නිදහස අරුත් ගැන්වෙන්නේ කෙසේ ද? එය ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම සාර්ථක වන්නක් ද? ඊට අයත්වන්නා වූ හෝ ආනුෂංගික ලක්ෂණයන් කවරේ ද? එහි සීමාවන් ඇත් ද? ඒවා කෙබඳු ද? ආදී වශයෙනි.

සැබෑ ජනමාධ්‍ය නිදහස යනු කුමක් ද? යන්න පිළිබඳ සාකච්ඡා කිරීම එක්තරා ආකාරයකින් මතවාද ඇවිස්වීමක් හෝ විවාදාත්මක දෙගිඩියාවක මං මුළාවීමක් වන්නට ද බැරි නැත. මා එසේ කියනුයේ මේ පිළිබඳ දහසකුත් එකක් විවිධ වූත් විෂම වූත් එකග විය හැකි මෙන් ම නොහැකි අදහස් හා ආකල්ප රාශියක් ප්‍රකට ව ඇති හෙයිනි.

කෙසේ වුව ද, අප මෙහි දී ජනමාධ්‍ය කෙරෙහි ලා ආරෝපණය කරවන්නට උත්සුක වන 'නිදහස' අර්ථ දක්වන්නේ කෙලෙස ද? එය පුළුල් වූත්, වඩාත් සංකීර්ණ වූත් අදහස් රැසක් ප්‍රකට කරවන්නකි. නිදහස පිළිබඳ මුල් ම සංකල්පය ලොව පහළ වන්නේ බුද්ධ භාෂිතයෙන් බව අපි උගෙන සිටිමු. පූර්ව බුද්ධෝත්පත්ති සමයේ දී එවකට සම්මත ව පැවැති බමුණු

මතිමතාන්තරවලින් ඈද, බැඳ සිරකොට සිටි ජනසමාජයට නිදහස පිළිබඳ සංකල්පය හෙළි කළෝ බුදුහු ය. (තවත් අයෙකුට මෙකී මතයට එරෙහි වීමට ද නිදහස ඇත) නිදහස් චින්තනය පිළිබඳ අපමණ පූර්වාදර්ශයන් බුදු දහම අධ්‍යයනයෙන් පැහැදිලි කරගත හැකි ය. 'නිදහස් චින්තනයෙන් තොර ලෝකය අන්ධකාර රාත්‍රියකැ'යි බුදුදහම පෙන්වා දෙයි. එහි කිසිත් නොපෙනේ. අඳුරේ අතපත ගාමින්, අයාලේ ඇවිදිමින් වෙහෙසට පත්වීම එහි සදාතනික ප්‍රතිඵලය යි.

ඇමෙරිකානු ජාතික ඇල්බෙයා කැමූ විසින් ඒ සම්බන්ධ ව කරන ලද ප්‍රකාශය ද ඊට ම සමාන ය. 'නිදහස නොමැති තැන ඇත්තේ වහල් බව කි. නිදහස ලබා දීම යනු යහපත් වීමට අවස්ථාව සලසා දීම යි'.

නිදහසේ වටිනාකම එයින් පැහැදිලි ය. නමුත්, ඒ ගැන කතා කිරීමේ දී එතැනින් නැවතිය නොහැකි ය. එහි යම්කිසි බැරෑරුම් බවක් ද ඇති බැවිනි. ප්‍රකට සාහිත්‍යධරයකු හා දාර්ශනිකයකු වූ ජෝර්ජ් බර්නාඩ් ෂෝ ඊට සපයා ඇති නිරුක්තිය ඒ පිළිබඳ කරුණු හෙළි පෙහෙළි කර ගැනීමට තවදුරටත් ආලෝකය සපයයි.

'නිදහස යනු වගකීම යි. බොහෝ මිනිසුන් එයට බිය වන්නේ එබැවිනි.'

දැන් අපට සිතිය හැක්කේ කුමක් ද? නිදහස එතරම් ම බැරෑරුම් ය. එය වගකීමක් ද වෙයි.

ඉතින් අප සාකච්ඡාවට ලක් කරන ජනමාධ්‍ය නිදහස ද එබඳු වගකීම්වලින් බැඳි එකක් බව අප අවිවාදයෙන් පිළිගත යුතු ව ඇත. ඒ මන්ද යත් ජනමාධ්‍ය වූ කලී සමස්ත ජන සමූහයාට වක්‍රව මෙන් ම ඍජු ව ද බලපෑම් එල්ල කරන (Direct and Indirect influences), සමාජය හසුරුවන ක්‍රියා පද්ධතියක් වන බැවිනි. කවුරුන් කෙසේ විරුද්ධ වුව ද, ජනමාධ්‍ය මගින් ජනවිඥානයට කළ හැකි බලපෑම අතිශය ප්‍රබල බව මම හඟිමි. සංඛ්‍යාලේඛන සමුදායකින් හෝ වෙනයම් සම්මත භෞතික මිනුමකින් මෙය මිනිය නොහැකි වුව ද, අද්‍යතන සමාජ ආර්ථික දේශපාලන රටාවන් හා ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ව කළ විධිමත් වූත්, පුළුල් වූත් පර්යේෂණයන්ගෙන් එය දැනටමත් ඔප්පු වී තිබේ.

පසුගිය දශකය තුළ ඌන සංවර්ධිත රටවල සාම්ප්‍රදායික සමාජයන්හි ඇති වූ සියලු ම තාක්ෂණික වෙනස්වීම් අතුරින් ඉතාම මූලික වූත්, මානව වර්ගයා කෙරෙහි පෑ බලපෑම් අතරින් සර්වව්‍යාපී වූත් වෙනස්වීම ජනමාධ්‍ය හා සම්බන්ධ[1] යැයි මහාචාර්ය මැක්ස් එෆ්. මිලිකන් විසින් කරන ලද ප්‍රකාශය මීට කදිම සාක්ෂියක් නොවන්නේ ද?

පුවත්පත, රූපවාහිනිය, ගුවන්විදුලිය හා සිනමාව ආදී ප්‍රධාන පෙළේ ජනමාධ්‍යයෝ මෙහි කොටස්කරුවෝ වෙති. 1974 අප්‍රේල් 09 වැනි ද වෝටර්ගේට් සිද්ධිය හෙළි කිරීමෙන් ඇමෙරිකානු ජනාධිපති රිචඩ් නික්සන්ට සිය පදවියෙන් ඉල්ලා අස්වීමට සිදු විය. රොබට් වුඩ්වර්ඩ් හා කාර්ල් බර්න්ස්ටයින් වැනි මාධ්‍යවේදීන් හට ප්‍රබල ජනමතයක් ගොඩනග න්නට හැකි වූයේ කෙසේ ද? උත්තරීතර ජනමාධ්‍ය සතු අති ප්‍රබල සමාජ බලපෑම හේතුවෙනි.

ඇමෙරිකාව හා ජපානය අත්සන් කළ 'ඔකිනාවා' ගිවිසුම අතර රහස් ව්‍යාපාරයක් ඇති බව පුවත්පතකින් කළ ප්‍රකාශයක් නිසා 1927 දී සමස්ත ජනමාධ්‍යවේදීන්ගේ උද්ඝෝෂණයේ බලපෑමෙන් එවකට බලසම්පන්න ව පැවැති 'සතෝ' රජයේ බිඳවැටීමත්, 'බෝපෝස්' අවි ගිවිසුම පිළිබඳ සත්‍ය කරුණු හෙළිදරව් වීම නිසා රාජීව් ගාන්ධිගේ ඉන්දියානු කොන්ග්‍රස් රජයේ අන්ත පරාජයත් ඊට කදිම නිදසුන් ය. එපමණක් නොව, දෙවන ලෝක සංග්‍රාම යුගයේ දී සීතලේ ගැහෙමින් සිය නිවෙස් තුළ ගිනි උඳුන් අසල අලස ව ගුලිගැසී සිටි කෝටි සංඛ්‍යාත ජනතාව දේශමාමකත්වයෙන් පුබුදුවාලන්නට උපකාර වූයේ අනෙකක් නොව, ජනාධිපති ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් හා අගමැති වින්ස්ටන් චර්චිල් ගේ ගුවන්විදුලි ඇමතුම් ය.

පවත්නා මතය රැක ගන්නට හෝ වඩවාලන්නට මෙන් ම විනාශ කරන්නටත්, තවත් නව මතයක් ගොඩනගන්නට ත් ජනමාධ්‍යයට ඉටු කරගත හැකි සමාජ හිතකාමී ජන මෙහෙවර මෙන් ම එහි අහිතකර පක්ෂය ද සලකා බැලිය යුතු ය. එබඳු වූ ජනමාධ්‍යයක් දැන හෝ නොදැන අයාලේ හෝ අත්තනෝමතික ව ක්‍රියාකරවීම අතිශය භයානක කටයුත්තකැයි මම විශ්වාස කරමි. ඒ මන්ද යත්, කොතරම් වාසි ප්‍රයෝජන ලැබීම හෝ තාවකාලික දේශපාලනික අභිමතාර්ථ ඉටු කර ගත්ත ද දීර්ඝ කාලීන ව ඉන් සිදු වන අනිටු විපාක වලකාලිය නොහැකි බැවිනි.

ඉතින්, එබඳු බාරදූර වූ ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය හා භාවිතය පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් මෙන් ම ජාතික වශයෙන් අප ලබා ඇති 'ඉඩකඩ' හා 'නිදහස' පිළිබඳ දැන් අපි සලකා බලමු.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මේ සඳහා හොඳ ම ආරම්භය යි.

'තම මතය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් සෑම කෙනෙකුට ම ඇත. බාධා කිරීම්වලින් තොර ව මතිමතාන්තර දැරීමේත් දේශසීමා නොසලකා කවර හෝ මාධ්‍යයක් මඟින් තොරතුරු හා අදහස් සෙවීමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ නිදහස මේ අයිතියට ඇතුළත් ය. ....[2]'

විශ්වීය ගුණයකින් යුක්ත පරම මානුෂික අයිතියක් ලෙස එහි අවධාරණය කෙරෙන 'නිදහස' වූ කලී සමස්ත මානව වර්ගයා එක ම ඥාතිත්වයකින් හා සහෝදරත්වයකින් බැඳ තබන්නක් ලෙස පෙනේ. නමුත්, විවිධ රටවල පවත්නා සමාජ, සංස්කෘතික හා දේශපාලනික රටාවන්ට අනුකූල ව සැකසුණු නීති අනපනත් මඟින් එකී 'පරම අයිතිය' එක්තරා ව්‍යාජයක් හෝ මිත්‍යාවක් බවට පත් කෙරෙන බැව් පැහැදිලි ය.

නිදසුනක් ලෙස, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ම දක්වන පරිදි එහි මූලික අයිතිවාසිකම් යටතේ, 'සෑම පුරවැසියකුට ම භාෂණයේ නිදහසට, ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය.[3]'

මෙහි දී යථෝක්ත 'පරම අයිතිය' අවධාරණය වෙයි. නමුත්, 'මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා' අර්ථ දැක්වීමේ දී 15 වන ව්‍යවස්ථාවේ 2 වන අනු ව්‍යවස්ථාවෙන් මෙසේ කියැවේ.

ඉහත ප්‍රකාශකොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස හෝ වරදකට පෙලඹවීම හා සම්බන්ධ ව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

මෙබඳු නෛතික සීමාවන් සහිත පසුබිමක් යටතේ අප මුලින් කී 'පරම ජනමාධ්‍ය නිදහසක්' අපට ඇත් ද? නැත. එකී ගැටලුකාරිත්වය පැනනඟිනුයේ

මෙහි බලපවත්වන 'නීතිය' පිළිබඳ තවදුරටත් අර්ථ දැක්වීමේදී ය. 'මහජන ආරක්ෂාව සඳහා තත්කාලයේ දී අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග මීට ඇතුළත් ය. පාර්ලිමේන්තුව හා සම්බන්ධ මෙකී ක්‍රියාකාරිත්වය එක්තරා දුරකට අසාධාරණ හා අයුක්ති සහගත සීමා පැනවීමක් බැව් මගේ හැඟීම යි.

ලෝකයේ කිනම් රටක වුව ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය හා භාවිතය සිදු විය යුත්තේ අත්‍යවශ්‍ය සීමා කිරීම් යටතේ බැව් මම පිළිගනිමි. රටේ ජීවත්වන පොදු මහජනතාවගේ එකමුතු බව රැකීම හා වැඩීමත්, ජනවාර්ගික හෝ ආගමික භේද ඇති නොකර මහජන යහපතම අරමුණු කොට ගැනීමත් සඳහා මෙන් ම ද්වේෂයෙන්, අපහාසයෙන් හා අශ්ලීලයෙන් තොර මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් අපේ අරමුණ විය යුතු ය. ඊට අවැසි විනයගරුක බව, විශ්වසනීයත්වය, හා උත්තරීතරභාවය ආරක්ෂා වන පරිදි යම් යම් නෛතික සීමාවන් පැනවිය යුතු බව ද අවිවාදිත ය. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නම් මෙකී ක්‍රියාකාරිත්වය මුළුමනින් ම ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය හරහා සිදු කෙරෙන්නකි. නමුත්, ආණ්ඩු වෙනස්වීමේ දී පාර්ලිමේන්තු බලතල මඟින් කලින් කලට ඔවුනොවුනට අවශ්‍ය යැයි හැඟෙන සීමාන්තික නීති සම්පාදනය කිරීම හා එකී නීතිවලට ම පිටස්තර ව ආසාධාරණ ලෙස සිදු කෙරෙන නීති උල්ලංඝනයන් හා බලහත්කාරකම් හා මැරකම් ද අප රටේ 'ජනමාධ්‍ය නිදහස' පිළිබඳ සැක පහළ කරවන්නකි.

ප්‍රවෘත්ති වටිනාකමකින් යුතු (News Worthy) වඩාත් සත්‍ය වූ විෂය මූලික වාර්තාකරණයක් (Objective Reporting) වුව ද නිසි සොයා බැලීම්වලින් තොර ව හුදු දේශපාලන අරමුණ නිසා රජයේ අනවශ්‍ය ඇඟිලිගැහීමකට (Unwanted Interference) ලක් කළ හැකි ය. එසේ නම් අත්‍යවශ්‍ය වූත්, සත්‍ය වූත් අනිවාර්යයෙන් පළ කළ යුතු පුවත් (Must Stories) ජනතාවට ලබා දෙන්නේ කෙසේ ද?

රජය, ජනමාධ්‍යකරුවා හා පුවත් පිපාසයෙන් පෙළෙන එමෙන් ම සත්‍ය දැන ගැනීමේ කුතුහලයෙන් පසුවන ජනතාව ද අතරමං වන්නේ මෙතැනදී ය. මෙවැනි බොහෝ පුවත් රජයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන බැවින් කොන්දේසි විරහිත ව ම නිෂ්ප්‍රභ කිරීම සාමාන්‍ය තත්ත්වය යි. නමුත්, ගැටලුව මෙය යි. ද්වේෂයෙන් තොරව, අපහාසයෙන් තොර

ව, හුදෙක් මහජන යහපත සඳහා ම වූ අවංක අරමුණකින් සැදුණු එබඳු ආණ්ඩු විරෝධී පුවත් හෝ ආකල්ප පළ කිරීමෙහි ලා රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය කෙබඳු ද? මෙය වඩාත් වැදගත් වන්නේ ශ්‍රී ලංකාවට ආශ්‍රිත ව ම සාකච්ඡා කිරීමෙනි. ඒ මන්දයත්, පසුගිය දශක දෙකහමාරක් තුළ අප ලැබූ සම්පතම අත්දැකීම් මේ සඳහා පහසුවෙන් අදාළ කරගත හැකි බැවිනි.

දැන්, අපි මුලින් සාකච්ඡා කළ 'ජනමාධ්‍ය නිදහස' කෙබඳු විය යුතු ද? යන්න තවදුරටත් අරුත් ගැන්විය හැකි ය. සැමදෙනා ම තමන් අනුමත කරන අදහස් පළ කිරීම ම ජනමාධ්‍ය නිදහස නොවේ. නැත්නම්, 'ඕනෑම සාපරාධී අදහසක් පළ කිරීමට ඇති නිදහස' ද නොවේ. ඊට සීමාවන් ඇත. එනම්, සමාජ, දේශපාලන, සංස්කෘතික හා ඓතිහාසික පරිසරය විසින් පනවනු ලබන සීමාවන් ය. ජනමාධ්‍යකරුවා ඒ සඳහා වන තමන්ගේ අයිතිය (Media Ownership) සාධාරණ ව භාවිත කරන්නේ නම් යුක්ති සහගතබවේ නිදහස (Plea of justification) ඔහුට අනිවාර්යයෙන් ම හිමි කර දිය යුතු ය. එබැවින්, මෙවැනි වතාවරණයක දී අවශ්‍යවන්නේ රජයේ සාධාරණ මැදිහත්වීමක් (Justifiable Intervention) පමණි. නීතියේ යුක්ති සහගතභාවය (Supremacy of the Law) රැකෙන්නේ එපරිද්දෙන් යැයි මම සිතමි.

එමෙන් ම හදිසි නීති රෙගුලාසි මඟින් විධායකයට බලතල පවරා දී තිබීමත්, සාමාන්‍ය ආඥා පනත් පිළිබඳ සලකා බැලීමේ දී පුවත්පත් මණ්ඩලයට අර්ධ අධිකරණ බලතල ලබා දීමත්, 1955 අංක 32 දරණ නිල රහස් ආඥා පනතේ 'නිල රහස්' පිළිබඳ විධිමත් විවරණයක් අවධාරණය නොකිරීම හා 1978 සංශෝධිත පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද නීතිය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල පාර්ලිමේන්තුව උදුරා ගැනීමත් යන කරුණු පදනම් කොටගෙන අප රටට වන යහපත් වූ ජනමාධ්‍ය නිදහසක් හුදු ව්‍යාජයක් බවට පත් වී ඇති බව මගේ විශ්වාසය යි.

එපමණක් නොව, ගවේෂණාත්මක පුවත්පත් කලාවේදී (Investigative Journalism) තොරතුරු මූලාශ්‍රවල රහසිගතභාවය රැකීම ජනමාධ්‍යවේදීන් ලැබිය යුතු මහඟු වරප්‍රසාදයක් මෙන් ම රැකිය යුතු විනය රීතියක් ද වෙයි. රටපුරා දිනෙන් දින වර්ධනය වෙමින් පවත්නා අල්ලස්, දූෂණ, වංචා හා සමස්ත සමාජයට හානිකර වූ ගසාකෑම් හා සූරාකෑම් අඩු කිරීම හෝ වළකාලීම මෙහි පරම අභිලාෂය යි. නමුත්, අප රටේ පුවත්පත් මණ්ඩල

පනතින් ඒ සඳහා ප්‍රමාණවත් පසුබිමක් සලසා දී නොමැති බව පෙනේ. මෙබඳු සීමාවන් ඔස්සේ අප ලබා සිටින 'නිදහස' ජනමාධ්‍ය කේන්ද්‍ර කොටගත් ජාතික සංවර්ධන කාර්යයෙහි ලා බලපාන්නේ වඩාත් අහිතකර ලෙස ය.

2011 ජූනි මස 21 වැනි දා විපක්ෂය විසින් පාර්ලිමේන්තුවට ගෙන එන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ යෝජනාව දෙවන වරටත් පරාජය කරවන්නට පාලක පක්ෂය කටයුතු කළේ ය. බදු බර ගෙවමින් පීඩාවට පත්ව සිටින ජනතාවට සිය රට තුළ කෙරෙන මුදල් ගනුදෙනු පිළිබඳ සැබෑ තොරතුරු දැන ගැනීමට නිදහසක් හෝ අවසරයක් නැත්තම්, එය රටේ අනාගතය සම්බන්ධයෙන් කෙතරම් හානිකර ද? දියුණුවෙමින් පවත්නා රට තුළ මිලියන ගණනින්, බිලියන ගණනින් සංසරණය වන මුදල් ගනුදෙනුවල සැබෑ තතු එරට ජනතාව නොදන්නේ නම් එය දැවැන්ත දූෂණයන්ට, වංචාවන්ට හා සාපරාධී මුදල් පරිහරණයට මෙන් ම රටට නොගැලපෙන සෙසු අවභාවිතයන්ටත් පාර කැපීමකි.

ප්‍රකට ජනමාධ්‍ය විචාරකයකු වූ විල්බර් ශ්‍රාම් 'ජනමාධ්‍ය හා ජාතික සංවර්ධනය' (Mass Media and the National Development) නම් සිය කෘතියෙහි පෙන්වා දෙන පරිදි තොරතුරු හුවමාරුව හා වඩ වඩාත් ඒ කෙරෙහි දැනුවත්ම්වීම යනු ජාතික සංවර්ධනය සඳහා වන යෝග්‍ය වාතාවරණය සැකසීමක් බව[4] සඳහන් කරයි.

'නිවැරදි තොරතුරු නොලබන ජාතියක් කවදා හෝ ඉතා ඉක්මනින් ම අනුන්ගේ වහලුන් බවට පත් වේ' යැයි කී හැරල්ඩ් ලැස්කි, (Harold Leskey) ඉන් ඔබ්බට ද අප සිතන්නට පොලඹවනුයේ 'අපට නිදහස තිබිය යුතු යි. නමුත්, එය පොදු නිදහසට බාධාවක් නොවිය යුතු යි' (Your Freedom must ends with my nose) යනුවෙන් අනතුරු ඇඟවීමක් ද කරමිනි.

මෙකී සකලවිධ ප්‍රකාශයන් විසින් නිරුක්ති සපයනු ලබනුයේ අපට හිතකර 'ජනමාධ්‍ය නිදහස කෙබඳු විය යුතු ද' යන්න කෙරෙහි ය. 'ප්‍රවෘත්ති' යනු ලෝකය අප වෙත විවර කරන කවුළුව යි'. එසේ නම් මිනිසා එදිනෙදා ලෝකය නිසි ලෙස හඳුනා ගන්නට 'සත්‍ය පුවත්' ලැබිය යුතු යි. එකී සත්‍යයේ ස්වභාවය කෙබඳු විය යුතු ද? යන්න මාධ්‍යවේදියා විසින් ම තීරණය කළ යුත්ත කි. මෙ තැන දී අප ගැඹුරින් කල්පනා කළ යුතු ව ඇත. ඒ මන්දයත්, මාධ්‍යවේදියා සත්‍යවාදී විය යුතුවා පමණක් නොව, ඔහු ඉදිරිපත් කරන සත්‍යය සාධාරණ ද විය යුතු බැවිනි. මෙහි සාධාරණය

ඉටු නොවීමේ ඍජු සමාජ ඵලයක් ලෙස විකල්ප මාධ්‍ය බිහිවීම වැලැක්විය නොහැක.

'අද සාමකාමී ව ප්‍රකාශ කිරීමට නොහැකි අදහසක් හෙට ප්‍රකාශ වන්නේ සාමකාමී නොවන ආකාරයට යි [5]' මෙය අප රටේ කෘතහස්ත නීතිවේදියකු ව සිටි ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර මාක් ප්‍රනාන්දු මහතා දැරූ අදහස යි.

ඒ අනුව, සැබෑ ජාතික නිදහස දිනා ගැනීමට නම්, නිදහස් චින්තනය නිරුපද්‍රිත විය යුතු ය. සමස්ත මානව පරපුරේ භාෂාවන්, ක්‍රියාකාරිත්වයන් ඊට බැඳුණු චර්යාවන් ද, සිතුම් පැතුම් හා අරමුණු අපේක්ෂාවන් ද යථාවත් වනුයේ ඒ අනුව ය. ස්වකීය දෛනික ජීවිතය තුළ සිදු කෙරෙමින් පවත්නා සකලවිධ ක්‍රියාවලීන් කෙරෙහි ස්වීයත්වයක් හා පීඩනයෙන් තොර, නොබැඳුණු බවක් විද්‍යමාන වනුයේ ඉන් පසුව ය. සමාජ ආර්ථික හෝ දේශපාලනමය වශයෙන් පුරවැසියා ලබන ලිහිල්භාවය භුක්ති විඳින්නට ලැබෙන ඉඩ ප්‍රස්ථාවන් විසින්, ඔවුන් පූර්ණ ජාතික නිදහසක් වෙත දිවෙන නිසි මං කරා යොමු කරවනු ලබයි. දියුණු භූගෝලීය කලාපයක වෙසෙන, අවබෝධය ඇති, ජාතික නිදහස සහිත ජන ප්‍රජාවකගේ අනන්‍යතාව ''හරවත් සැහැල්ලුව'' බව මාඕ සේතුං විටෙක අවධාරණය කළේ එබැවිනි. ඒ අනුව, නිදහස් චින්තනය හා බැඳුණු ජනමාධ්‍ය නිදහස, වඩාත් පුළුල් ජාතික නිදහසක් සඳහා වූ ශක්ති සම්පන්න පදනමක් ලෙස හඳුනාගත යුතු ය.

පාදක සටහන්

1. *Millicon, Max. F. (1983) Communication Revolution, Edited by Daniel Lerner and Wilbur Schramm, Will Hoocks, N.Y.*
2. *1948 දෙසැම්බර් මස 10 වෙනි දින එක්සත් ජාතීන්ගේ මහා සංගමය විසින් ප්‍රකාශ කළ, එහි පළමු ව්‍යවස්ථාව මගින් පිළිගන්නා ලද, මානවහිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තිය.*
3. *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, III වන පරිච්ඡේදය, 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව 'අ' උපවගන්තිය, 06 පිටුව.*
4. *දිසානායක, විමල් (1974) ජනසන්නිවේදනය හා සමාජය, නිපුන ප්‍රකාශන, කිරුලපන, 22 පිටුව.*
5. *පීරිස්, ජී. එල්. (1983) 'ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය හා ජනමාධ්‍ය' ලිපිය, 'නීතිය හා ජනමාධ්‍යය'-(සංස්.) එස්. මද්දුමබණ්ඩාර, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 11 පිටුව.*